ANOJA MILANTHI



# සැඟවුණ ධර්මප්‍රිය ගැන බිරිය අනෝජා රටට කියයි

**මමට ධර්මප්‍රිය මුණගැහුණු අතීතය මතක් කරමු?**
පාසල් යන කාලේ මම අමතර පන්ති යනකොට අහම්බෙන් වගේ තමයි අපි මුණගැහුණේ.

**මුණගැහෙනකොට ඔහු කොහොම කෙනෙක්ද?**
දැන් ටිකක් හැන්පන් චරිතයක්. ඒ කාලේ ඉතින් එහෙම නැහැ.

**පෙම්වතා කාලේ?**
අනවශ්‍ය බර ඔළුවට ගන්නේ නැතිව සැහැල්ලුවෙන් නිදහසේ සිටිය කෙනෙක්.

**සැමියෙක් විදියට ඔහු?**
වගකීම් දරන, සැහැල්ලුවෙන් ඉන්න කෙනෙක්.

**ජනප්‍රිය වීමට පෙර?**
ජනප්‍රිය වීමට පෙර, පසු කියලා වෙනසක් නැහැ. එදා හිටිය කෙනාම තමයි. ඔහු ඒක ලොකුවට ඔළුවට ගත්ත කෙනෙක් නෙමෙයි.

**ඔහුගේ ජනප්‍රියත්වය ඔබට බලපාන විදිය?**
ඒකේ හොඳ වගේම නරකත් තියෙනවා. සමහර වෙලාවට හොඳයි. තවත් වෙලාවකට කරදර වෙන අවස්ථාත් තියෙනවා.

**කලා කටයුතුවල නිරත වුණ ඔහුට පවුල සහ ඔබව මගහැරෙන්නෙම නැද්ද?**
කොච්චර කාර්යබහුල වුණත් අපි වෙනුවෙන් පොඩි කාලයක් හරි වෙන්කරන්න එයා කාලය උත්සාහ කරනවා.

**ඔහුට ජීවිතයේ මගහැරුණ දේවල් තියෙනවද?**
හොඳ පිටපතක් ලියලා හොඳ අධ්‍යක්ෂවරයෙක් වෙන්න ආසාවෙන් ඉන්නවා. ඒක ටිකක් මඟහැරිලාදෝ කියලා හිතෙනවා.

**ඔහු වගකීම් දරන්න පුළුවන් පුද්ගලයෙක්ද?**
ඔව්. ඔහුට හොඳට වගකීම් දරන්න පුළුවන්.

**සාමාන්‍ය ජීවිතයේදී ඔහු?**
අනිත් අය ගැන හිතන, හැඟීම් බර, සරල කෙනෙක්. එයාට අනෙක් අයව තේරෙන ඉක්මනට අනෙක් අයට එයාව තේරෙන්නේ නැහැ.

**ඔහු ජීවිතය ගැන සැහැල්ලුවට හිතන කෙනෙක්ද? සීරියස් හිතන කෙනෙක්ද?**
එයා කොහොමත් සැහැල්ලුවෙන් ඉන්න චරිතයක්. නමුත් අවශ්‍ය තැනදී හරියට හිතලා බලලා වැඩ කරනවා.

**ඔහු අද ඉන්න තැන ගැන සතුටු වෙනවාද?**
ඔව්.

> එයා අනෙක් අයවත් සතුටු කරගෙන සතුටින් ඉන්න කෙනෙක්.

**දුක හිතුණොත් ඔහු?**
ටිකක් තරහත් යනවා. කා එක්කවත් කතා නොකර ඉන්නවා.

**සතුටු හිතුණොත්?**
එයා කොහොමත් හයියෙන් කතා කරන, හයියෙන් සිනාවෙන කෙනෙක්. සාමාන්‍යයෙන් එයා අනෙක් අයවත් සතුටු කරගෙන සතුටින් ඉන්න කෙනෙක්.

**තරහා ගියොත්?**
කා එක්කවත් කතා නොකර පාඩුවේ ඉන්නවා.

**වැඩිපුරම යන්න කැමති තැන?**
පිටරටවල සංචාරය කරන්න කැමැතියි.

**ඔහු වැඩිපුරම ආදරේ කරන්නේ කාටද?**
මටයි, බබාලා දෙන්නටයි තමයි.

**ඔහුට නැතිවම බැරි අය?**
අපි තුන්දෙනා, එයාගේ පවුලේ අය, එයාගේ යාළුවෝ.

**ඔහු විශේෂ විලාසිතාවලටද කැමති?**
තැනට සුදුසු විදියට පිළිවෙළට අඳින්න තමයි කැමැති. මම තමයි ගොඩක් වෙලාවට එයාගේ ඇඳුම් තෝරන්නේ.

**ඔහු ගැන අහන්න ලැබුණ සතුටුම ආරංචිය?**
ලැබෙන ඔක්කොම සතුටුදායක ආරංචි තමයි. එයා හොඳ සැමියෙක්, හොඳ තාත්තා කෙනෙක් වගේම හොඳ චරිතාංග නළුවෙක්. ඒ ඇගයීම එයාට ලැබෙනකොට සතුටුයි.

**ඔබ ඔහුගේ කැමැති නැති ගතිගුණය?**
එයාට ටිකක් කේන්ති යන එක.

**ඔහු ගැන අපි නොදන්න රහස් ?**
එයා වගා කරන්න ආසයි. එයාට සින්දු කියන්න පුළුවන්. ඒ වගේම ගිටාර් වාදනය කරන්නත් පුළුවන්.

**ඔහු වැඩිපුරම සතුටු වුණ දවස?**
සරසවි සම්මානය ලැබුණ දවස වගේම ලොකු පුතා හම්බවුණ දවස.

**ඔහු ජීවිතයේ ජය ගන්න දේවල්?**
දැන් ඉන්න තත්ත්වයට එන්න හැමදේම මහන්සිවෙලා කරගත්තේ එයාමයි.

**ඔහු ජීවිතයේ ලොකු වටිනාකමක් දෙන දේවල්?**
ඉගෙනීමට, දරුවන්ගේ අධ්‍යාපනයට, වේදිකා නාට්‍යවලට වගේම කලාවටත් ලොකු වටිනාකමක් දෙනවා.

**විනෝදාංශ?**
වගා කිරීම, පොත් කියවීම, සංචාරයට වගේම ගිටාර් වාදනයටත් ආසයි.

**ඔහු ඔබට දීලා තියෙන වටිනාම තෑග්ග?**
සාමාන්‍යයෙන් ඔහු මට දෙන්නේ ඔක්කොම වටිනා තෑගි.

**ඔහුට ගැළපෙනම නිළිය?**
මට හිතෙන්නේ ජයනි සේනානායක අක්කා තමයි එයාට ගැළපෙන්නේ.

■ ලක්මිකා දිවාංජලී වීරකෝන්

